# ශ්‍රී ලංකා ජනාධිපති ජී-7 වාටියේ රැස්වීමට එක්වෙයි

## Sri Lankan president attends G7 "outreach meeting"

**නන්ද වික්‍රමසිංහ**
**2016 ජුනි 3**

ජපානයේ පවත්වන ලද ජී 7 රැස්වීම අවසානයේ, පසුගිය මැයි 27 දා පවත්වනලද එහි අතිරේක "වාටියේ හමුවකට" ජපන් අගමැති ශින්සෝ අබේ ගෙන් ඇරයුම් ලද ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන ද සහභාගී වී ඇත. මෙම රැස්වීමට සහභාගී වූවන් අතර ඉන්දුනීසියාව, වියට්නාමය, බංග්ලාදේශය, ලාඕසය, පැපුවා නිව්ගිනි (පීඑන්ජී) සහ චැඩ් යන රාජ්‍යයන්හි දේශපාලන නායකයෝ ද වූ හ.

සිරිසේනට මෙම රැස්වීම සඳහා ආරාධනයක් ලැබීම, ශ්‍රී ලංකාව ලද "මහා ජයග්‍රහනයක්" යයි ද රට ලෝක ප්‍රජාවගෙන් "හුදෙකලාවීමේ අවසානය" යයි ද ලංකාවේ ආන්ඩු නායකයෝ ද කොලඹ මාධ්‍ය ද හුවා දැක්වූ හ. ප්‍රීතියට පත් සිරිසේන, අබේ, බරක් ඔබාමා, ජර්මානු චාන්සලර් ඇන්ජෙලා මර්කල් සහ බ්‍රිතාන්‍ය අගමැති ඩේවිඩ් කැමරන් යන ලෝක නායකයන් යයි කියන අය සමග කතා කරමින් සිටින හැටි පෙන්නූ රූපවාහිනී නාලිකා, එය ඔවුන් සමග පවත්නා උනුසුම් මිත්‍රත්වයේ සලකුනකැයි වර්නනා කලෝ ය.

මෙම රැස්වීමේ ප්‍රධාන අරමුන මූලෝපායික ය. එනම් මෙයට අදාල රටවල්, ජපානයට ද එක්සත් ජනපදයට ද විශේෂයෙන්ම ඔබාමාගේ "ආසියාවට හැරීමට" ද චීනයට විරුද්ධ යුද සූදානමට ද වඩාත් තදින් බැඳ ගැනීම ය. සිරිසේනට ආරාධනා කිරීම ම පෙන්නුම් කලේ, ඔහුගේ ආන්ඩුව කොයිතරම් වේගයකින් ශ්‍රී ලංකාව එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ භූ දේශපාලන වැඩසටහනට බැඳ දමා ඇති ද යන්නය.

චැඩ් දේශය හැර අනෙකුත් සියලු ආරාධිත රටවල් යුද හවුල් ජාලයක් මගින් චීනය වැටලීමට එක්සත් ජනපදයේ මූලිකත්වයෙන් දැරෙන උත්සාහයට වැදගත් ය. වියට්නාමය සහ ලාඕසයට චීනය සමග පොදු දේශසීමා තිබේ. ඉන්දුනීසියාව, බංග්ලා දේශය, ශ්‍රී ලංකාව සහ ඊට වඩා තරමක් අඩු ප්‍රමානයකට පැපුවා රාජ්‍යය, අප්‍රිකාව සහ මැද පෙරදිග සමග චීනයේ වෙලඳාමට තීරනාත්මක ලෙස වැදගත් වන ඉන්දියානු සහ පැසිෆික් සාගර අතර මුහුදු මාර්ග වල වැදගත් ස්ථානයන්හි පිහිටා ඇත.

2011දී නිලවශයෙන් දියත් කරනලද එක්සත් ජනපදයේ මිලිටරි හා මූලෝපායික "ආසියාවට හැරීම" මුලුමහත් ප්‍රදේශය පුරාම ආතතීන් දරුනු ලෙස උග්‍ර කර තිබේ. චීනයට එරෙහිව සිය භෞමික අයිතිවාසිකම් වඩ වඩාත් තියුනු ලෙස ඉදිරිපත් කරන ලෙස ඔබාමා පාලනාධිකාරය ජපානය උසිගන්වමින් සිටියි. එසේම, වියට්නාමය සහ පිලිපීනය විසින් දකුනු චීන මුහුදේ අයිතිවාසිකම් කියාපෑමට වොෂිංටනය සාහය දී තිබේ. ගතවූ වසරවල අවස්ථා තුනකදී පෙන්ටගනය, චීනය අයිතිය පාන කුඩා දූපත් කිහිපයක් වටා, මුහුදු සැතපුම් 12ක භෞමික සීමාව තුලට "නාවික ගමනාගමනයේ නිදහස" යන කඩතුරාව යටතේ, ඇමරිකානු යුද නැව් ප්‍රකෝපකාරී ලෙස යවා තිබේ.

ජී 7 සමුලුවට කේන්ද්‍ර වූයේ, ධනේශ්වර ක්‍රමයේ ගැඹුරු වන ගෝලීය අර්බුදයද චීනයට එරෙහි එක්සත් ජනපද -මූලික යුද සූදානම ද වේ. සමුලුව අග දී නිකුත් කරන ලද ජී 7 නිවේදනය, කෙලින්ම චීනය නම් කලේ නැති වුව ද දකුනු චීන මුහුදේ "නාවුක ගුවන් ගමන් නිදහස" ට සීමා නොපැනවිය යුතු යයි අනතුරු ඇඟවීය.

රැස්වීමේ දී, සිරිසේන මෙසේ කිය, "ජී 7 රටවල් අප ඇති කල වෙනස්කම් අගය කල සැටි මම දනිමි. මගේ ආන්ඩුව පාලනයේ විප්ලවවාදී වෙනසකුත් සමග, බහුපාර්ශවීය සමාජයක් තුල  ශක්‍ය සංවර්ධන සහ සංහිඳියා වාතාවරනයක් සඳහා මාවතක්  ද ඇති කර තිබේ."

සිරිසේනගේ යහපාලන ය, පෙනෙන සංවර්ධනය සහ සංහිඳියාව පිලිබඳ කතන්දර, ශ්‍රී ලංකාවේ කම්කරු සහ පීඩිත ජනයා ට හුදෙක් හිස් ප්‍රලාපයන්ය. බෙදුම්වාදී දෙමල විමුක්ති කොටි සංවිධානය යුදමය වශයෙන් පරාජය කිරීමෙන් වසර හතකට පසුව ද තවමත් රටේ උතුර සහ නැගෙනහිර පවතින්නේ දැඩි මිලිටරි පාලනයක් යටතේ ය. කම්කරුවන්ගේ සහ තරුනයින්ගේ අරගල යටපත් කිරීමට පොලිස්-රාජ්‍ය විධික්‍රම යොදාගනු ලැබේ.

සිරිසේනගේ "විප්ලවවාදී වෙනස" වනාහි  අන් කිසිවක් නොව, විදේශ පිලිවෙත බෙයිජිනයෙන් පිටතට සහ වොශිංටනය පැත්තට මාරුකිරීමය. සිරිසේන 2015 ජනාධිපති වරනයේදී ලත් ජයග්‍රහනය, වොශිංටනය විසින් අටවන ලද රාජ්‍ය-තන්ත්‍ර මාරුවක් හැර අන් කිසිවක් නොවේ. එක්සත් ජනපදය සිරිසේනගේ පූර්වගාමියා වූ මහින්ද රාජපක්ෂ ජනාධිපති ධුරයෙන් ඉවත්  කිරීමට ක්‍රියා කලේ රාජපක්ෂගේ යුද අපරධ හෝ ප්‍රජාතන්ත්‍ර විරෝධී විධික්‍රම නිසා නොව ඔහු බෙයිජිනය සමග පවත්වාගෙන ගිය සම්බන්ධකම් නිසාය.

"වාටියේ" හමුවේ දී නිකුත් කල  ඒකාබද්ධ ප්‍රකාශයක දී  ජපානය සහ ශ්‍රී ලංකාව, "නීතියේ අධිකාරය උඩ මුහුදේ නිදහස  සහ නාවුක පර්යාය පවත්වාගැනීමේ වැදගත් කම තහවුරු කරගත්හ." එක්සත් ජනපදයේ සහ එහි සහචරයින්ගේ භාෂාවෙන් "නාවුක ආරක්ෂාව" යනුවෙන් හැඟවෙන්නේ, නැගෙනහිර සහ දකුනු චීන මුහුදේ  චීන සැලසුම් වලට අභියෝග කිරීමය. මේවා වනාහි  යුද ගැටුමකට තුඩුදෙන පියවරයන් ය.  සමුද්‍ර ආරක්ෂක කටයුතු වලදී දෙරට අතර සයෝගයේ කොටසක් ලෙස,  අබේ ලංකාවට  නාවුක මුර යාත්‍රා දෙකක් දීමට පොරොන්දු වීම අර්ථභාරීය.

ජනාධිපතිවරයා සම්මේලනයට ගියේ වචනයේ අර්ථයෙන් ම හිඟන පොල්කටුව අතේ තියාගෙනය. ඔහු මෙසේ අයැද සිටියේ ය. "අපට පලල් සංවර්ධන වැඩවලට සල්ලි නැත. එනිසා අපි දියුනු රටවලින් සහ බහු පාර්ශවිය ආයෝජකයන්ගෙන් ඉල්ලා සිටින්නේ ලංකාවේ මුදල් ආයෝජනය කරන ලෙස ය."  30 අවුරුදු  සිවිල් යුද්ධයකින් වැනසී ගිය මෙම දිවයින දැන් ලෝක  ධනේශ්වර ක්‍රමයේ අර්බුදයෙන් තදින් බැටකමින් සිටියි.

මුදල් ඉල්ලා කෙරෙන සිරිසේනගේ පින්සෙන්ඩුවෙන් පෙන්නුම්  කෙරෙන්නේ, තමන්ගේ ජීවන තත්වයන්ට එරෙහිව එල්ල කෙරෙන නිර්දය ප්‍රහාරයන්ට විරුද්ධව පුපුරු ගසමින් ඇති කම්කරු හා පීඩිත ජනතාවගේ ප්‍රතිරෝධය පිලිබඳව ආන්ඩුවේ සැලීමයි. ගිය මස මුල සිට ආන්ඩුව,  ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් නියම කරන ලද බදු නැංවීම, පුද්ගලීකරනය සහ කප්පාදු වැඩසටහන් ක්‍රියාවට නගමින් සිටියි.

ජපන් අගමැතිවරයා හමුවීමෙන් ඉක්බිතිව සිරිසේන දෙරට අතර ඒකාබද්ධ ප්‍රකාශයකට අත්සන් කලේ ය. අබේ විදුලි බල සම්ප්‍රේශන රැහැන් ඇදීම හා ජලසම්පාදනය සඳහා යෙන් බිලියන 38ක (ඩොලර් මිලියන 340ක) නය ලබාදීමට පොරොන්දු විය.

බංග්ලාදේශයේ අගමැතිනි ශීක් හසීනා සමග පැවැත්වූ වෙනම රැස්වීමකදී එරටට ඩොලර් බිලියන 5ක නයක් දීමට පොරොන්දුවූ අබේ ඉන් බිලියන 1.5ක් වහාම ලබාදෙන බවට පොරොන්දු විය. ජපානය වියට්නාමය ට ද  තවත් සංවර්ධන ආධාර ලබාදෙන බවට පොරොන්දු විය. එක්සත් ජනපදයේ ආසියාවට හැරීම පිටුපසින් පෙල ගැහෙන ටෝකියෝව ඒ අතර ම,  තමන්ගේම අධිරාජ්‍යවාදී භූ දේශපාලනික අවශ්‍යතා වෙනුවෙන් ද ක්‍රියා කරයි.

© www.wsws.org